# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2183/47 - 2020 ජූලි මස 10 වැනි සිකුරාදා - 2020.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/15/02/2012.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.02.22 දින දරන නියෝගයෙන්, බේරුම් කිරීම මගින් විසඳීම සඳහා මොරටුව, කල්දෙමුල්ල, ඊබට් පටුමග, අංක 185/5බී හි පදිංචි එච්. එන්. පෙරේරා මිය, හික්කඩුව, වැවල, හිල් හවුස් (ඒ), හි පදිංචි ලලිතා ලාලනී කොඩිතුවක්කු මිය සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609, හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3505 දරන ප්‍රදාන 2019.08.19 දිනැති අංක 2137/6 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2020.02.27 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූනි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය :* IR/15/02/2012.

කාර්මික අධිකරණය

1. එච්. එන්. පෙරේරා මිය,
   අංක 185/5බී,
   ඊබට් පටුමග,
   කල්දෙමුල්ල,
   මොරටුව.

2. ලලිතා ලාලනී කොඩිතුවක්කු මිය,
   හිල් හවුස් (ඒ),
   වැවල,
   හික්කඩුව.

නඩු අංකය : A 3505

*පළමු පාර්ශවය*

සහ

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 609,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.02.22 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඒ අනුව මා විසින් 2019.06.24 වැනි දින ලබා දුන් ප්‍රදානයට අර්ථ නිරූපනයක් ලබා දීම සඳහා මා වෙත නැවත යොමු කර ඇත. ඒ අනුව අර්ථ නිරූපනය පහත පරිදි වේ.

එම ප්‍රදානයට අනුව,

1. එච්. නන්දා පෙරේරා මිය :

වර්ෂ 2006 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි A /7, A /6, A /5 ශ්‍රේණියන්ට අයත් සියලුම දීමනා සහිත හිඟ වැටුප්.

| 2006 ජනවාරි මස සිට | රු. ශත | රු. ශත | |
|---|---|---|---|
| 2009 මැයි | A /7 | 261,600.00 | |
| 2009 ජුනි මස සිට 2012 මැයි | A /6 | 287,562.32 | |
| 2012 ජුනි සිට 2015 පෙබරවාරි | A /5 | 488,087.38 | 1,037,249.70 |

2. ලලිතා ලාලනි කොඩිතුවක්කු මිය :

වර්ෂ 2006 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි A /7, A /6, A /5 ශ්‍රේණියන්ට අයත් සියලුම දීමනා සහිත හිඟ වැටුප්.

| 2006 ජනවාරි මස සිට | රු. ශත | රු. ශත | |
|---|---|---|---|
| 2009 මැයි | A /7 | 261,600.00 | |
| 2009 ජුනි මස සිට 2012 මැයි | A /6 | 287,562.32 | |
| 2012 ජුනි සිට 2014 ඔක්තෝබර් | A /5 | 310,545.32 | 859,7070.64 |
| සම්පූර්ණ හිඟ වැටුප් දීමනා සමග | | | 1,896,957.34 |

අදළ සියලු හිඟ වැටුප් සහ නඩු ගාස්තු 2020.03.31 වැනි දිනට පෙර සහකාර කම්කරු කොමසාරිස් නමින් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**එස්. එම්. එස්. ජයවර්ධන,**
බේරුම්කරු.

2020 පෙබරවාරි මස 27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

07 - 705

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.